ශීර්ෂය 209 - ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 209 - ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 19 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 මැයි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංසෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංසෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.
  මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමෙහි 2023 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.20,297,664 ක් වුවද 2024 ජනවාරි 01 දිනට ශේෂය රු.20,285,893 ක් ලෙස දක්වා තිබුණි.ඒ අනුව වෙනස රු.11,772 ක් විය.	2023 හා 2024 වර්ෂයේ මෙම වෙනස හඳුනාගෙන ඇති අතර එම වෙනස ඇති වූ ආකාරය මෙතෙක් අනාවරණය කර ගැනීමට නොහැකි වී ඇති බැවින් මේ සම්බන්ධයෙන් තවදුරටත් කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි.	රු.11,772 ක වෙනස හඳුනාගෙන නිවැරදි කළ යුතු වන බව.

(ආ) **දේපල පිරියත හා උපකරණ**

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය විසින් 2018 දෙසැම්බර් 31 දින නිකුත් කරන ලද මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීමේ මාර්ගෝපදේශයේ 1.3.1 වගන්ති ප්‍රකාරව සෑම වාහනයක් සඳහාම වර්ෂ 05 කට වරක් තක්සේරුවක් ලබා ගැනීම අනිවාර්ය වුවත්, දෙපාර්තමේන්තුව සතු වාහන වල වටිනාකම තක්සේරු කිරීමකින් තොරව රු.17,484,320 ක් ලෙස සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි.	වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව සතු වාහන තක්සේරු කිරීම සඳහා තක්සේරු මණ්ඩලයක් පත්කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය විසින් 2018 දෙසැම්බර් 31 දින නිකුත් කරන ලද මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීමේ මාර්ගෝපදේශයේ උපදෙස් ප්‍රකාරව කටයුතු කර තක්සේරු වටිනාකම් දැක්විය යුතු බව.
(ii)	2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 හි 8.2 ඡේදය ප්‍රකාරව තවදුරටත් වාර්තා කල යුතු මූල්‍ය නොවන වත්කම් පවතීනම් ඒවා පිරිවැයට හෝ පිරිවැය හඳුනාගත නොහැකි අවස්ථාවලදී තක්සේරු අගයට ගිණුම්ගත කල යුතු වුව ද දෙපාර්තමේන්තුවේ මහනුවර ශාඛා කාර්යාලයේ ඉඩම හා ගොඩනැගිල්ල එලෙස ගිණුම්ගත කර නොතිබුණි.	මෙම දෙපාර්තමේන්තුවට අයත් මහනුවර කාර්යාලයේ ඉඩම හා ගොඩනැගිල්ල තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත 2024.12.19 හා 2024.11.29 දිනැති ලිපි මඟින් දැනුම් දී ඇති අතර ඒ අනුව ඉදිරි කටයුතු කරමින් පවතින බව දන්වා තිබුණි.	මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුයත
(iii)	දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය පිහිටි ඉඩම හා ගොඩනැගිල්ල රු.3,668,702,000 කට තක්සේරු කර 2024 අප්‍රේල් 17 දින තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු වාර්තාවක් නිකුත්කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ දී ද එම ඉඩම හා ගොඩනැගිල්ල ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.	දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය පිහිටි ඉඩම හා ගොඩනැගිලි තක්සේරු දෙපාර්තමේන්තුවෙන් කරන ලද තක්සේරුවට අනුව 2025 පෙබරවාරි මස ගිණුම් සාරාංශය මඟින් ගිණුම්ගත කර ඇති බව දන්වා තිබුණි.	තවදුරටත් වාර්තා කල යුතු මූල්‍ය නොවන වත්කම් පවතීනම් පිරිවැයට හෝ තක්සේරු අගයට ගිණුම්ගත කල යුතුයි.

(ඇ) **අග්‍රිම ශේෂය**

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 දෙසැම්බර් 31 දිනට මැතිවරණ කාර්යාලය විසින් පියවීමට නියමිතව තිබුණු අග්‍රිම ශේෂය රු.423,825 ක වටිනාකම 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ	ඉදිරියේදී එවැනි නොපිය වූ අත්තිකාරම් (මැතිවරණ), නිවැරදිව සටහන් කිරීමට කටයුතු කරන අතර 2025.02.28 දින මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන දින	නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වන බව.

	මුදල්වල ශුද්ධ වෙනස්වීම් යටතේ සටහන් කළ යුතු වුවත්**,** මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් ලෙසින් සටහන් කර තිබූ අතර 2024 වර්ෂය සඳහා අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශනයෙහි **(ACA – 3)** මෙම වටිනාකම පියවා ඇත්නම් ඒ බවද, නොඑසේනම් නොපිය වීමට හේතු සඳහන් කිරීම යටතේද සටහන් කළ යුතු වුවද ඒ අනුව සටහන් කර නොතිබුණි.	වන විට එම රුපියල් 423,825.00 ක නිරවුල් නොවූ අත්තිකාරම් පැවති නමුත් 2025 මාර්තු මස ගිණුම් සාරාංශයෙන් එය නිරවුල් කර ඇති බව දන්වා තිබුණි.	

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	නිසි අධ්‍යයනයකින් යුතුව ඇස්තමේන්තු පිළියෙළ කර නොතිබීම හේතුවෙන් පුනරාවර්තන වැය විෂයයන් 15 ක ශුද්ධ ප්‍රතිපාදන එකතුව රු.49,044,974 ක් වූ අතර, වියදම රු.16,224,580 ක් හා ප්‍රතිපාදන ඉතිරිය රු.32,820,393 ක් විය. එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයට සියයට 20 සිට සියයට 88 ක් දක්වා පරාසයක් ගෙන තිබුණි.	වැය විෂයයන් 15 ක ප්‍රතිපාදන ඉතිරිය රු.32,820,393 ක් ලෙසට සඳහන්ව තිබුණත්, බැරකම් අඩුකළ පසු ඉතිරිය සියයට 5 සිට සියයට 79 දක්වා වෙනස් වන බව දන්වා තිබුණි.	නිසි අධ්‍යයනයකින් යුතුව ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වන බව.
(ආ)	මූලධන වැය විෂයයන් 09 ක මුළු ශුද්ධ ප්‍රතිපාදන එකතුව රු.1,101,200,000 ක් වූ අතර, වියදම රු.254,727,668 ක් හා ප්‍රතිපාදන ඉතිරිය රු.846,472,331 ක් විය. එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයට සියයට 23 සිට සියයට 99 ක් දක්වා පරාසයක් ගෙන තිබුණි.	ඇස්තමේන්තු සංශෝධනය හා කොන්ත්‍රාත් කාලය දීර්ඝ වීම අපේක්ෂිත පරිදි අළුත්වැඩියාවන් සිදු නොවීම, 01/2024 පරිදි වියදම් පාලන නිසා ප්‍රතිපාදන ඉතිරි වී ඇති බව දන්වා තිබුණි.	නිසි අධ්‍යයනයකින් යුතුව ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වන බව.
(ඇ)	පුනරාවර්තන වැය විෂයන් 02 ක් සඳහා ප්‍රතිපාදිත රු.1,500,000 ක් වූ සමස්ථ ප්‍රතිපාදනය ඉතිරිවී තිබුණි.	වියදම් දැරීමට අවස්ථාවක් උද්ගත නොවීම, වියදම් සීමා කිරීම ගිවිසුම් කටයුතු ආරම්භ නොවීම වැනි හේතු නිසා ප්‍රතිපාදන ඉතිරි වී ඇති බව දන්වා තිබුණි.	නිසි අධ්‍යයනයකින් යුතුව ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වන බව.

(ඈ)	ප්‍රාග්ධන වැය විෂයන් 03 ක් සඳහා ප්‍රතිපාදිත රු.123,500,000 ක් වූ සමස්ථ ප්‍රතිපාදනය ඉතිරිවී තිබුණි.	වියදම් දැරීමට අවස්ථාවක් උද්ගත නොවීම, වියදම් සීමා කිරීම ගිවිසුම් කටයුතු ආරම්භ නොවීම වැනි හේතු නිසා ප්‍රතිපාදන ඉතිරි වී ඇති බව දන්වා තිබුණි.	නිසි අධ්‍යයනයකින් යුතුව ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වන බව.
(ඉ)	209-1-1-1409-138/11 වැය විෂයය සඳහා ප්‍රතිපාදිත රු.2,000,000 සහ වර්ෂය තුල මුදල් රෙගුලාසි 66 මඟින් රු.7,699,406 ක් මාරු කරගෙන තිබූ අතර රු.9,699,406 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් උපයෝජනය කර තිබුණේ රු.2,131,262 ක් පමණි. මේ අනුව මුදල් රෙගුලාසි 66 මාරු කිරීම් මඟින් ලබාගත් ප්‍රතිපාදන වර්ෂය අවසාන වන විටත් උපයෝජනය කර නොතිබුණු බවත්, මුළු ශුද්ධ ප්‍රතිපාදනයට ප්‍රතිශතයක් ලෙසට ඉතිරි කිරීම් සියයට 78 ක්ව පැවතුණි.	209-1-1-1409(138) වැය විෂයය යටතේ 2024.12.31 දිනට මුළු ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස ඉතිරි ප්‍රතිපාදන සියයට 78 ක් ලෙස විගණනයේදී හඳුනාගෙන ඇතත් 2024.12.31 දිනට බැරකම් ලෙස රුපියල් 4,558,790.00 ක ප්‍රතිපාදනයක් බැරකම් ලේඛනයේ සටහන් කර ඇත. ඒ අනුව ඉතිරියේ ප්‍රතිශතය සියයට 31ක් බව පෙන්වා දෙමි.	නිසි අධ්‍යයනයකින් යුතුව ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වන බව.

3.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

	විගණන නිරීක්ෂණය	**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	එක් පුනරාවර්තන වැය විෂයයක් සඳහා ප්‍රතිපාදිත රු.700,000 කින් රු.682,277 ක් වැය කිරීමෙන් පසු රු.17,723 ක් ඉතිරිව පැවතියද එම ඉතිරිය ඉක්මවා රු.2,532,328 ක බැරකම් වලට එළඹ තිබුණි.	2022 වර්ෂයට අදාළ බැරකමකි. එය 2024 වර්ෂයේ බැරකම් ප්‍රකාශනයෙන් ඉවත් නොකිරීම හේතුවෙන් තවදුරටත් 2024 වර්ෂයේ බැරකමක් ලෙස පෙන්නුම් කර ඇත. 2025 වර්ෂයේ අප්‍රේල් මස CIGAS ගිණුම්කරණ පැකේජයෙන් මෙම බැරකම ඉවත්කර ගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතු වන බව.
(ආ)	රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව බැරකම් පිළිබඳ ප්‍රකාශය - (i) (ඇමුණුම iv) ආකෘතිය සම්පූර්ණ කර මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් කර නොතිබුණි.	ඉදිරි වර්ෂයන් වලදී මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශන අංක 6/2024 අනුව බැරකම් පිළිබඳ ප්‍රකාශය (1) ඇමුණුම් **(IV)** ආකෘතිය නිසි ලෙස සම්පූර්ණ කර මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ 06/2024 අනුව සිදුකළ යුතු වන බව.

3.3. නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නිරීක්ෂණය			ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	**වටිනාකම රු.**	**අනුකූල නොවීම**		
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 4.5 හා 4.6 ඡේද සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ අංක 3.1 මගින් ප්‍රකාශිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 113 (6) හා මාර්ගෝපදේශ අංක 01 හි (ඉ) හා (ඊ)	254,876	2024 දෙසැම්බර් 31 දිනට සේවය හැර ගිය සේවකයන්ගෙන් අයවිය යුතු රු.254,876 ක් වූ ණය ශේෂය චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකර නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	මේ වන විට සේවය හැරගිය නිලධාරීන් 04 දෙනෙකුගේ ආපදා ණය/විශේෂ අත්තිකාරම් හා උත්සව අත්තිකාරම් අයකර ගැනීමට ඇති අතර රුපියල් 25,000/- කට අඩු ණය ඇති නිලධාරීන් දෙදෙනෙකුගේ ණය රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2024(1) ප්‍රකාරව කපා හැරීම සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති බව ද අනෙකුත් නිලධාරීන් දෙදෙනාගේ පුද්ගලික ලිපිනයට, ලිපි යොමු කර ඇති බව දන්වා තිබුණි.	අත්තිකාරම් "බී" ගිණුමට අදාළ හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වන බව.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගොඩනැගිල්ල සඳහා ජංගම රාක්ක පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා 2024 වර්ෂයේ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය රු.543,000,000 ක් වූ අතර, වර්ෂය තුළ උපයෝජනය කර තිබුණේ රු.126,875,685 ක් පමණි. 2024 ජූනි මස 12 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අංක අමප/24/0906/620/015-1 හා 24 **(ii)**(ආ) අනුව මෙම ව්‍යාපෘතිය 2024 වර්ෂයේ ප්‍රතිපාදන මගින් කඩිනමින් නිම කළ යුතු වුවත්, මෙම ව්‍යාපෘතිය සඳහා 2024 පෙබරවාරි 15 සිට 2024 නොවැම්බර් 07 දින දක්වා කිහිපවරක් ලංසු කැඳවා 2024 දෙසැම්බර් 10 දින කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර 2024	2023 වර්ෂයේ වෙළඳපළ මිල ගණන් ඉහළ යාම හේතුවෙන් ඇස්තමේන්තුව සංශෝධනය වූ බැවින් නැවත අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමට සිදු විය. ඒ අනුව 2024 වර්ෂයේ පෙබරවාරි 15 දින ලංසු කැඳවීම සිදු කළ අතර එම ලංසු සියල්ල ප්‍රතික්ෂේප වීම මත 2024.09.26 දින නැවත ලංසු කැඳවීමක් සිදු කර Tudawe Engineering Services (Pvt) Limited වෙත කොන්ත්‍රාත්තුව මේ වන විට ප්‍රදානය කර එහි	ජංගම රාක්ක පද්ධතිය ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය කඩිනමින් අවසන් කළ යුතු වන බව.

	දෙසැම්බර් 24 දින අත්තිකාරම් ගෙවීමක් පමණක් සිදුකර තිබුණි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ වගකීම ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ (පාලන) වෙත පැවරී ඇති නමුත්, මෙම සංවර්ධන ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය සියයට 23 ක් හා භෞතික ප්‍රගතියක් නොතිබුණි.	කාර්යයන් ආරම්භ කර ඇත. මේ වන විට මූල්‍ය ප්‍රගතිය රුපියල් මිලියන 132.64 ක් බව දන්වා තිබුණි.	
(ආ)	දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කර මධ්‍ය වායුසමන ගිනි නිවන සහ උසස් ආරක්ෂණ පද්ධතීන් ස්ථාපනය කිරීම වෙනුවෙන් 2018 දෙසැම්බර් 26 දින කොන්ත්‍රාත්තුව පිරිනමා ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරන ලද නමුත්, ව්‍යාපෘතිය ඉදිකිරීම් කටයුතු තාවකාලිකව නවතා තිබුණි. 2024 මැයි 28 දින අමාත්‍ය මණ්ඩල තීරණයන් අනුව 2026 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කර තිබුණු අතර, නිශ්චිත කාලරාමුවක් තුළ වැඩ අවසන් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස නියෝග කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය රු.550,000,000 ක් වුවද, වර්ෂය තුළ උපයෝජනය රු.123,195,665 ක් වූයෙන් මූල්‍ය ප්‍රගතිය සියයට 22 ක් පමණ විය.	සංශෝධිත ඇස්තමේන්තුව හා කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමට අදාලව අමාත්‍ය මණ්ඩල තීරණය ලැබීමෙන් අනතුරුව ප්‍රධාන ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණ කටයුතු 2024 ජූනි මස දී ආරම්භ කර ඇත. ඒ හේතුවෙන් 2024 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ප්‍රතිපාදන වලින් රුපියල් 123,145,665.00 ක් පමණක් උපයෝජනය කිරීමට සිදුවු බව දන්වා තිබුණි.	ප්‍රධාන ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනමින් අවසන් කළ යුතු වන බව.
(ඇ)	විශ්වාසදායික ඩිජිටල් කෝෂ්ඨාගාරයක් පිහිටුවීම සඳහා 2021 අප්‍රේල් 20 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ මඟින් අනුමැතිය ලබාදී තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ දී මෙම ව්‍යාපෘතිය සඳහා රු.120,000,000 ක් ප්‍රතිපාදනය වෙන් කර තිබුණි. Atom හා Archivematica යන මෘදුකාංග ස්ථාපිත කිරීමට හා නඩත්තුවට විදේශීය වෘත්තීය සමාගමක් තෝරා ගැනීමටත්, සර්වර් පරිගණක හා ධාරිතාව ලබා ගැනීමටත් අමාත්‍ය මණ්ඩලය වෙත අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් යොමු කිරීමටත් 2024 අගෝස්තු 28 දිනැති දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබුණු නමුත් 2024 දෙසැම්බර් 31 දක්වාත් ඒ සඳහා කටයුතු කර නොතිබුණි.	ජාතික ලේඛනාගාරයේ විශ්වාසනීය ඩිජිටල් කෝෂ්ඨාගාරයක් ස්ථාපිත කිරීම (අදියර 01) ව්‍යාපෘතියේ සංශෝධිත අයවැය සහිත ව්‍යාපෘති යෝජනාව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු තීරණය මත ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත 2024.10.07 දින යොමු කර තිබුණි. ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් 2024.12.26 හා 2025.03.05 දිනැති ලිපි මඟින් එම ව්‍යාපෘති යෝජනාව අනුමත කර ඇත. ඒ අනුව, අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශය අමාත්‍යාංශය වෙත 2025.03.24 දින යොමු කර ඇති බව දන්වා තිබුණි.	විශ්වාසදායී ඩිජිටල් කෝෂ්ඨාගාරයක් පිහිටුවීමේ ව්‍යාපෘතිය කඩිනමින් අවසන් කළ යුතු වන බව.

4.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

විගණන නිරික්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 47(4) උපවගන්තිය ප්‍රකාර වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසාන වී දින 180 ක් හෝ ඊට පෙර ප්‍රකාශයට පත් කළ යුතුය. 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව මෙම කාර්යසාධන වාර්තාව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනයට ඉදිරිපත් කළ යුතුය. එසේ වුවද මෙම වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමග විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව සකස් කරන ලද කාර්ය සාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කිරීමට නොහැකි වූයේ තොරතුරු රැස් කිරීමේදී සිදු වූ අපහසුතා හේතුවෙනි. ඒ අනුව එම තොරතුරු නොපමාව ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	අදාල නියමයන් ප්‍රකාරව කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතු වන බව.

4.3 වත්කම් කළමනාකරණය

විගණන නිරික්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2012 වර්ෂයේදී දෙපාර්තමේන්තු නව ගොඩනැගිල්ලේ සවිකරන ලද **CCTV** කැමරා 23 කින් මේ දක්වා ක්‍රියාකාරී තත්ත්වයේ පවතින කැමරා සංඛ්‍යාව 09 ක් පමණක් වූ අතර, අක්‍රීය තත්ත්වයේ පවතින ඉතිරි කැමරා 14 අළුත්වැඩියා කිරීමට හෝ ප්‍රමාණවත් පරිදි නව කැමරා සවි කිරීමට කටයුතු කර නොතිබුණි.	ක්‍රියාත්මක තත්ත්වයේ පැවති කැමරා අත්‍යාවශ්‍යම ස්ථාන ආවරණය වන පරිදි නැවත ස්ථානගත කරන ලද අතර නව කැමරා (03) ක් හා නෙට් වර්ක් ස්වීච් 02 ක් අළුත්වැඩියා කර සවි කර ඇත. ප්‍රධාන ගොඩනැගිල්ලට සම්බන්ධ වී ඇති නවතම CCTV පද්ධතියක් සවි කිරීමට අදාළ සැලසුම්වල කෙටුම්පතක් උපදේශන ආයතනයක් සමඟ සාකච්ඡා කර ඇති අතර, ඒ සඳහා ඇස්තමේන්තුව ලද පසු, 2025 වසර ඇස්තමේන්තු ඉල්ලීමට ඇතුළත් කිරීමට නියමිත බව දන්වා තිබුණි.	දෙපාර්තමේන්තුවේ පවතින ලේඛන ආරක්ෂා කිරීමට පියවර ගත යුතු වන බව.

4.4 කළමනාකරණ දුර්වලතා

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දෙපාර්තමේන්තු අධිලේඛන තැන්පත් කිරීම සඳහා රු.19,237,273 ක මුදලට මිලදී ගත් අම්ල රහිත ලේඛන තැන්පතු පෙට්ටි 2,512 ක් අරමුණුගත කාර්යය වෙනුවෙන් නොයොදවා එම පෙට්ටිවල ගුණාත්මකභාවය ආරක්ෂා වීමට අවශ්‍ය ආරක්ෂක විධි විධාන පිළිබඳ අවධානය යොමු නොකරමින් 2024 ජනවාරි 29 දින සිට මූල්‍ය ප්‍රකාශන දිනය දක්වාම ගබඩා කර පැවති බවත්, ජංගම රාක්ක පද්ධතිය නිසි පරිදි ස්ථාපිත කර අවසන් වීමට පෙර අම්ල රහිත තැන්පතු පෙට්ටි 2,512 ක් මිලදී ගැනීම නිසා වසර 05 ක වගකීම් කාලසීමාවෙන් වසරකට වැඩි කාලයක් අරමුණුගත කාර්යය වෙනුවෙන් භාවිතා නොකර නිශ්කාර්යාව තැබීම තුළින් මිලදී ගැනීමේ අරමුණු ඉටු වී නොතිබුණි.	රාක්ක පද්ධතිය ස්ථාපිත වීම ප්‍රමාද වීම හේතුවෙන් මෙම තත්ත්වය පැන නැඟී ඇත. තෝරාගත් කොන්ත්‍රාත්කරු මඟින් රාක්ක ඉදිකිරීම ආරම්භ කර ඇත. තවද, බහාලුම් ඉතා විශාල ප්‍රමාණයක් දික් කිලෝමීටර් 24 ක පමණ තැන්පත්ව ඇති පැරණිතම අධිලේඛන හා ප්‍රකාශන තැන්පත් කිරීම සඳහා අත්‍යාවශ්‍ය වේ. ඒ සඳහා ප්‍රතිපාදන වෙන් වන විට අවශ්‍ය බහාලුම් මිලදී ගැනීමේදී ආනයනය කිරීම සඳහා ද සැපයුම්කරුට කාලය ලබාදිය යුතු බැවින් මිලදී ගැනීමේ ක්‍රියාවලිය කල් ඇතිව වර්ෂය මුල ආරම්භ කළ යුතුය යන්න දන්වා තිබුණි.	ප්‍රසම්පාදන තීරණ ගැනීමේදී නිසි අවධානයකින් යුතුව කටයුතු කල යුතුය.

5. යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (1) වගන්තිය ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර පවත්වාගෙන යා යුතු වුවත්, 2024 මැයි 01 දින සිට අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩු වී පැවතීම නිසා 2024 වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අභ්‍යන්තර විගණන අංශය අක්‍රිය වී පැවතුණි.	නිරීක්ෂණය හා එකඟ වන බව දන්වා තිබුණි.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (1) වගන්තිය ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර පවත්වාගෙන යා යුතු වන බව.

5.2 විගණන හා කළමනාකරණ කමිටුව

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2019 ජනවාරි 12 දිනැති අංක DMA/01 – 2019 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය අනුව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් කාර්තුවකට 01 බැගින් වර්ෂයකට අවම රැස්වීම් 04 ක් පැවැත්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.	දැනට අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩු අතර ඒ සඳහා නිලධාරියෙකු වැඩ බැලීමට පත්කරන ලෙස 2024.08.23 දිනැතිව අමාත්‍යාංශය වෙත ඉල්ලීමක් යොමු කර ඇත. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ඒකාබද්ධ සේවයේ මානව සම්පත් කළමනාකරණ පද්ධතිය (MISCO) යාවත්කාලීන කර ඇති බව දන්වා තිබුණි.	චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතු වන බව.

6. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 286 ක් වුවද, තත්‍ය කාර්ය මණ්ඩලය 148 ක් වීමෙන් පුරප්පාඩු සංඛ්‍යාව 138 ක් වූ අතර, එය අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 48 ක් විය. මෙම පුරප්පාඩු සංඛ්‍යාව විධායක මට්ටමේ තනතුරු 09 කින්ද, තෘතියික මට්ටමේ තනතුරු 15 කින්ද, ද්විතියික මට්ටමේ තනතුරු 110 කින්ද, ප්‍රාථමික මට්ටමේ තනතුරු 04 කින්ද සමන්විත වූ අතර, එය දෙපාර්තමේන්තුවේ කටයුතු පවත්වාගෙන යාම කෙරෙහි අහිතකර ආකාරයට බලපා තිබුණි.	2023 නොවැම්බර් 28 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ලබා ගන්නා ලද අනුමැතිය ප්‍රකාරව පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් ක්‍රියාත්මක කරන ලද බව දන්වා තිබුණි.	අත්‍යවශ්‍ය සේවක පුරප්පාඩු ප්‍රමුඛතාවයකින් යුතුව පිරවීමට කටයුතු කළ යුතු වන බව.
(ආ)	ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ (චිත්‍රපට හා ශ්‍රව්‍ය දෘශ්‍ය), ජාතික ලේඛනාගාර නියෝජ්‍ය අධ්‍යක්ෂ (විද්‍යුත් ලේඛන හා අංකිතකරණ), ජාතික ලේඛනාගාර නියෝජ්‍ය අධ්‍යක්ෂ (තාක්ෂණ), අභ්‍යන්තර විගණක, ජ්‍යෙෂ්ඨ ලේඛනාරක්ෂක, ප්‍රධාන සංරක්ෂණ නිලධාරී (චිත්‍රපට) ප්‍රධාන සංරක්ෂණ නිලධාරී (ශ්‍රව්‍ය දෘශ්‍ය) ප්‍රධාන සංරක්ෂණ නිලධාරී (අධිලේඛන), භාෂා පරිවර්තක යන වෘත්තීය නිලධාරීන්ගේ දැඩි හිඟය හේතුවෙන් දෙපාර්තමේන්තුවේ අධිලේඛන හා වාර්තා කළමනාකරණය, අධිලේඛන වලට ප්‍රවිශ්‍ය වීම සහ අධිලේඛන සංරක්ෂණය යන ප්‍රධාන කාර්යයන් සඳහා දැඩි ලෙස අහිතකර බලපෑම් එල්ලවී ඇති බව නිරීක්ෂණය විය.	ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ විධායක සේවා සනය සඳහා වන බඳවා ගැනීම් (SL 01) සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/OPR/GEN/07/2025 හා 2025.03.07 දිනැති ලිපියෙන් ඉදිරි කටයුතු සඳහා සාකච්ඡා කිරීමට කටයුතු කරන අතර අදාළ බඳවා ගැනීමෙන් අනතුරුව වෘත්තීය නිලධාරීන්ගේ දැඩි හිඟය හේතුවෙන් දෙපාර්තමේන්තුවේ අධිලේඛන හා වාර්තා කළමනාකරණය, අධිලේඛන වලට ප්‍රවිශ්‍ය වීම හා අධිලේඛන සංරක්ෂණය යන ප්‍රධාන කාර්යයන් සඳහා ඇති වන අහිතකර බලපෑම් අවම කර ගත හැකි වන බව දන්වා තිබුණි.	එම